යම් යම් පුවත් මාධ්‍ය තුළින් ඉදිරිපත් වීමේදී එම පුවත් වාර්තාවන් අන්තර්ගතයේ නොමැති ඇතැම් ගැටළුකාරී යෙදුම් සිරස්තලයන් තුළ දක්නට ලැබීම අප විසින් මීන් පෙරද සංවාදයට ලක් කොට ඇත. ඇතැම් අවස්ථාවක පුවත්පත් කර්තෘවරුන් විසින් සිරස්තලයට වැඩි ආකර්ෂණයක් ලබාදීම සඳහා හෝ සිරස්තලය තුළ අඩු වචන ප්‍රමාණයක් පවත්වා ගැනීම සඳහා යොදාගන්නා මෙම යෙදුම් ගැටළුකාරී යැයි අපි අසන්නේ, එම යෙදුම් කෙතරම් දුරට ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක්ද යන කාරණය සමගිනි.

මීට උදාහරණයක් ලෙසින් පහත අරුණ, දිනමිණ හා ලංකාදීප පුවත් වාර්තාවන්හි දක්නට ලැබුණු "ජාවාරමා/ජාවාරමුන්" යන යෙදුම් දැක්විය හැක. අරුණ (02/12) සහ ලංකාදීප (02/11) පුවත් වාර්තාවන් අන්තර්ගතය තුළ "ජාවාරම්කරුවන්" යනුවෙන් දැක්වෙන බවද මෙහිදී පෙන්වා දිය යුතුවේ. මේ අනුව, ජාවාරමා/ජාවාරමුන් වැනි යෙදුම් සහිත භාෂා භාවිතයක් ඔස්සේ මාධ්‍ය මගින් සිදුකරන්නේ ශිෂ්ට සම්පන්න චින්තනයක් හැඩගැස්වීමට බාධාවක් නොවේද? එවැනි භාෂා භාවිතයක් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna #Dinamina #Lankadeepa